චක්‍රලේඛ අංක:1993/21

මගේ අංකය: විද්‍යා 3/5/විළුව.
විද්‍යා ශාඛාව,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1993.10.15 දින.

පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත.

## රජයේ පාසල් සඳහා විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය මිල දී ගැනීම සහ බෙදා හැරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දහතුන් වන සංශෝධනයෙහි, නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවෙහි (පළාත් සභා ලැයිස්තුවෙහි) පරිශිෂ්ටය 111 හි 22 වන වගන්තිය අනුව "අමාත්‍යාංශය විසින් සඳහන් කරන නිශ්චිත උපකරණ සමරහක් හැර, විද්‍යා උපකරණ ලබා ගැනීම සහ බෙදා හැරීම" පළාත් සභාවලට පවරා ඇත.

මේ සම්බන්ධයෙන් ඔබ විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පහත දක්වේ.

1.0 විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය මිල දී ගැනීම.

1.1 මේ අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන නිශ්චිත විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය හැර, අනෙකුත් විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ලබා ගැනීම මින් ඉදිරියට ඔබ විසින් කළ යුතු වේ. මේ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඔබට ලැබෙන සාමූහික ප්‍රතිපාදනයෙන් වෙන් කරවා ගෙන ලබා ගත යුතු වේ.

1.2 රජයේ පාසල්වලට ලබා දිය යුතු විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ජාතික අධ්‍යාපන ආයතනය විසින් නියම කරනු ලැබ ඇත. මේ උපකරණ සහ රසායන ද්‍රව්‍ය පහත සඳහන් පරිදි ලේඛන දෙකක් යටතේ දක්වේ:

(අ) 6 සිට 13 වසර තෙක් පන්ති සඳහා විද්‍යා උපකරණ අවශ්‍යතා සම්මත ලේඛනය (ඇමුණුම 1).

(ආ) 4 වසර හා 5 වසර පන්ති සඳහා විද්‍යා උපකරණ අවශ්‍යතා සම්මත ලේඛනය (ඇමුණුම 2).

1.3 මේ අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන "නිශ්චිත විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය" ලේඛනය 'ඇමුණුම - 3' යටතේ දක්වේ.
මේ ලේඛනය අවශ්‍යතා අනුව වරින් වර සංශෝධන කරනු ඇත.

1.4 ඇමුණුම 1 හි සහ ඇමුණුම 2 හි සඳහන් විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය අතුරින් අමාත්‍යාංශය විසින් සඳහන් කර ඇති නිශ්චිත උපකරණ සහ රසායන ද්‍රව්‍ය හැර ඉතිරි උපකරණ හා ද්‍රව්‍ය මිල දී ගෙන සැපයීම ඔබගේ සම්පූර්ණ වගකීම වේ.

1.5 ඔබ විසින් මිළ දී ගනු ලබන විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය, ජාතික අධ්‍යාපන ආයතනය විසින් නියම කරනු ලැබ ඇති පිරිවිතරවලට අනුකූල විය යුතුය. මේ පිරිවිතර ඇමුණුම 2 හිත් ඇමුණුම 4 හිත් දක්වා ඇත.

1.6 ඇමුණුම 1 සහ 2 වශයෙන් ඇති ලේඛනවල එක් එක් උපකරණයෙන් සැපයිය යුතු සංඛ්‍යාව වශයෙන් දක්වා ඇත්තේ, සිසුන් 30 කින් යුත් පන්තියකට අවශ්‍ය සංඛ්‍යාව වේ. ආදර්ශන උපකරණ සම්බන්ධයෙන් සැපයිය යුතු යැයි දක්වෙන සංඛ්‍යාව මුළු පාසලට ම අදාළ සංඛ්‍යාව වේ.

එක් එක් රසායන ද්‍රව්‍යයෙන් සැපයිය යුතු ප්‍රමාණය වශයෙන් දක්වා ඇත්තේ, සිසුන් 30 බැගින් යුත් පන්තියකට වර්ෂ 5 ක් සඳහා අවශ්‍ය ප්‍රමාණය වේ.

1.7 එක් එක් වර්ෂය සඳහා පළාත වෙනුවෙන් මිළ දී ගන්නා විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය පිළිබඳවත් ඒවායින් මිළ දී ගත යුතු සංඛ්‍යාව හා ප්‍රමාණය පිළිබඳවත් ඔබ විසින් පළාත් විද්‍යා-ගණිත මෙහෙයුම් කමිටු සම්බන්ධීකරණ ලේකම්ගේ නිර්දේශය ලබා ගත යුතුය.

තවද එසේ මිළ දී ගනු ලබන විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය

I ජාතික අධ්‍යාපන ආයතනයන් අනුමත "විද්‍ය උපකරණ අවශ්‍යතා සම්මත ලේඛනය" (ඇමුණුම 1 සහ 2) ට ඇතුළත් ඒවා බවටත්,

II ඒවා මේ චක්‍රලේඛයේහි ඇමුණුම 2 හි හා ඇමුණුම 4 හි දක්වා ඇති පිරිවිතරවලට අනුකූල බවටත්,

III ඒවා, ඇමුණුම - 3 හි දක්වා ඇති මේ අමාත්‍යාංශය විසින් මිළ දී ගනු ලබන, 'නිශ්චිත විද්‍යා උපකරණ ලේඛනය' ට ඇතුළත් <u>නොවන</u> බවටත්,

සහතිකයක් පළාත් විද්‍යා ගණිත මෙහෙයුම් කමිටු සම්බන්ධීකරණ ලේකම්ගෙන් ඔබ ලබා ගත යුතු ය.

1.8 එක් එක් වර්ෂය අවසානයේ දී, ඒ වර්ෂය සඳහා ඔබ විසින් මිළ දී ගන්නා ලද විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ලේඛනයක්, මිළ ගණන් ද සහිත ව මේ අමාත්‍යාංශයේ "විද්‍යා ශාඛාව" වෙත කරුණාකර ඉදිරිපත් කරන්න.

අමාත්‍යාංශය විසින් මිළ දී ගනු ලබන "නිශ්චිත විද්‍යා උපකරණ" ලේඛනය සංශෝධනය කිරීම "විද්‍යා ශාඛාව" වෙත කරුණාකර ඉදිරිපත් කරන්න.

1.9 මේ චක්‍රලේඛයෙහි ඇමුණුම 1, 2 සහ 4 වශයෙන් දක්වා ඇති ලේඛනවල කිසියම් සංශෝධනයක් ඔබ නිර්දේශ කරන්නේ නම්, ඒ පිළිබඳව මේ අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාව වෙත කරුණාකර දන්වන්න.

අලුතින් විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ලේඛනවලට එකතු කිරීම හා ලේඛවලින් ඉවත් කිරීම, සැපයිය යුතු උපකරණ සංඛ්‍යා/ප්‍රමාණ අඩු වැඩි කිරීම්, පිරිවිතර වෙනස් කිරීම එවැනි සංශෝධන සඳහා නිදසුන් වේ. සංශෝධන නිර්දේශ කිරීමේ දී ඊට හේතු ද දක්විය යුතු බව කරුණාවෙන් සලකන්න.

2.0 <u>විද්‍යා උපකරණ බෙදා හැරීම</u>

විද්‍යා උපකරණ බෙදා හැරීම මින් ඉදිරියට ඔබගේ වගකීම වනු ඇත. මේ අමාත්‍යාංශය විසින් මිළදී ගනු ලබන විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ද පාසල් වෙත බෙදා හැරීම සඳහා ඔබ වෙත එවනු ඇත.

මේ අමාත්‍යාංශයේ මධ්‍ය විද්‍යා උපකරණ ගබඩාවෙන් කෙළින් ම පාසල් වෙත විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය නිකුත් කිරීම මින් ඉදිරියට සිදු නොකෙරෙනු ඇත.

3.0 ජාතික පාසල් සඳහා විද්‍යා උපකරණ සැපයීම.

ජාතික පාසල්වල විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය අවශ්‍යතා සැපයීම සම්බන්ධයෙන් උපදෙස් වෙනම නිකුත් කරනු ඇත.
කෙසේ වෙතත්, ජාතික පාසල්වලට ද සැපයිය යුත්තේ, මෙහි ඇමුණුම 4 හි සඳහන් අනුකූල වන, ඇමුණුම 1හි හා 2හි ඇතුළත් කර ඇති විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය වේ.

4.0 පළාත් විද්‍යා උපකරණ ගබඩා පිහිටුවීම.

ඉහත 1.0 හා 2.0 යටතේ දක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා ඔබ විසින් පළාත් මට්ටමින් විද්‍යා උපකරණ ගබඩා පිහිටුවා ගත යුතු වේ. පළාත් විද්‍යා උපකරණ ගබඩා වශයෙන් පාසල් ගැනීම නොකළ යුතු ය. පළාත් විද්‍යා උපකරණ ගබඩා පිහිටුවීම සම්බන්ධයෙන් දැනටමත් අංක: විද්‍යා 1/ක්‍රියා සහ 1990.01.11 දින දරණ, 1990/4 චක්‍රලේඛය මගින් ඔබට උපදෙස් දී කරුණාකර එහි 7 පිටුවෙහි 7 ඡේදය බලන්න.

5.0 කුඩා විද්‍යාගාර සැපයීම.

පාසල් වෙත කුඩා විද්‍යාගාර සැපයීම මගින් ද, විද්‍යා උපකරණ සැපයීමක් සිදුකෙරේ. පාසල්වලට කුඩා විද්‍යාගාර සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් - දානපතියන්ගේ පරිත්‍යාග, ආධාර, විමධ්‍යගත අයවැය යටතේ ගරු මන්ත්‍රීතුමන්ලාට වෙන් කැරෙන මුදල්, පළාත් සභා ජනනය කරනු ලබන වෙනත් අරමුදල් ආදී විකල්ප මාර්ග මගින් ලබා ගනු ඇතැයි අපේක්ෂිත

6.0 විවිධ සංවිධාන, ව්‍යාපෘති ආදිය මගින් විද්‍යා උපකරණ.

රාජ්‍ය අංශයේ මෙන්ම රාජ්‍ය නොවන විවිධ සංවිධාන, ව්‍යාපෘති ආදිය මගින් ද, විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය රජයේ පාසල්වලට සපයනු ලැබේ. එවැනි අවස්ථාවල දී ද, එසේ සපයනු ලබන විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය, මෙහි ඇමුණුම 1, 2 සහ 4 ට අනුකූල වන බවට කරුණාකර වග බලා ගන්න.

7.0 විද්‍යා උපකරණ මිළ දී ගැනීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් මීට කළින් මවිසින් නිකුත් කර ඇති 1990/13 සහ 1992/10 දරණ චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

එන්. වී. කේ. කේ. වීරගොඩ.
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු ලේකම්.

පිටපත්:-

1. පළාත සභා ප්‍රධාන ලේකම්වරුන්.
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
3. පළාත් විද්‍යා-ගණිත මෙහෙයුම් කමිටු සම්බන්ධීකරණ ලේකම්වරුන්.
4. නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විද්‍යා) වරුන්.
5. ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.
6. ගණකාධිකාරී/අභ්‍යන්තර විගණන, - එම-
7. විගණකාධිපති.